# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2025 අංක 15 දරන සමෘද්ධි (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2025 අගෝස්තු මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2025 අගෝස්තු මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල :** රු. 10.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2025 අංක 15 දරන සමෘද්ධි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2025 අගෝස්තු මස 22 වන දින]

එල්.ඩී. - ඕ 52/2024

### 2013 අංක 1 දරන සමෘද්ධි පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2025 අංක 15 දරන සමෘද්ධි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2013 අංක 1 දරන පනතට 28අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

2. (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2013 අංක 1 දරන සමෘද්ධි පනතේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 28අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය: -

"සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල ගිණුම් විගණනය කිරීම

**28**අ. රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන, සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල ගිණුම් විගණනය කිරීම සඳහා අදාළ කර ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 35අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 35අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:-

"සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවල ගිණුම් විගණනය කිරීම

**35**අ. රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවල ගිණුම් විගණනය කිරීම සඳහා අදාළ කර ගත යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.